# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு


පොදු කාර්යාලය : 011-2868441, 2868442, 286844
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය : EC/EDR/LAE/2023/04B<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2023.01.20<br>திகதி |

සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත,

**චක්‍රලේඛ අංක - 40**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023**
**දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු කාර්යාල කටයුතු පරිසීමා කිරීම හා අවභාවිතාව වැළැක්වීම.**

දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාල හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල පිහිටි රජයේ පරිශ්‍රවල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ධුර දරන අමාත්‍යවරුන්ගේ හෝ මන්ත්‍රීවරුන්ගේ කාර්යාල ද පිහිටුවා ඇත. අනිසි බලපෑම්වලින් තොරව නිදහස් හා සාධාරණ ලෙස ක්‍රියාත්මක විය යුතු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නාම යෝජනා භාරගැනීම, තැපැල් ඡන්ද නිකුත් කිරීම, තැපැල් ඡන්ද සලකුණු කිරීම සහ ඡන්ද ප්‍රතිඵල වගුගත කිරීමේ කාර්යයන් වැනි ව්‍යවස්ථාපිත කාර්යයන් ද මෙම පරිශ්‍ර ආශ්‍රිතව සිදු කිරීමට නියමිතව පවතී.

02. එබැවින් මෙම ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රාජ්‍ය සම්පත් අවභාවිතාව වැළැක්වීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අංක 2313/32 හා 2023.01.04 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය හා 2023.01.05 දිනැති අංක 20 දරන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි. එම ගැසට් පත්‍ර හා චක්‍රලේඛයේ පිටපත් මේ වන විටත් ඔබ වෙත එවා ඇත. එබැවින් එකී කමිටු කාර්යාලවල දේශපාලනමය ස්වරූපයේ මහජන හමුවීම් හා රැස්වීම් පැවැත්වීම නොකළ යුතු අතර, කිසිදු පක්ෂ/ අපේක්ෂක/ කණ්ඩායම් ප්‍රවර්ධනය කිරීමට හෝ වෙනත් පක්ෂ/අපේක්ෂක/ කණ්ඩායම් අගතියට පත්වන ආකාරයේ කටයුතු සිදුවීම් වැළැක්වීමට ක්‍රියා කරන ලෙස ඒවායේ භාරකාරීත්වය හා පාලනය භාරව සිටින නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

03. එසේ වුවද එම කමිටු කාර්යාල මගින් දිස්ත්‍රික්කයේ කෙරෙන සංවර්ධන කාර්යයන් සිදු කිරීමට බාධාවක් මෙමගින් අපේක්ෂා නොකරන අතර ඡන්ද විමසීමට සම්බන්ධවන පාර්ශ්ව, තරග වදින අපේක්ෂකයන්ගේ හෝ ජනතාව ඒකරාශී කිරීමකින්/ සහභාගීත්වයකින් තොරව එම කාර්යයන් සිදුකළ හැකි ය. එසේ වුවද ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියක් ලබා ගත යුතු බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා ඔබගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කරමි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත්-
සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත - කාරුණික දැන ගැනීම පිනිස හා අවශ්‍ය කටයුතු සඳහා